සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2018
# චිත්‍ර කලාව

**09 ශ්‍රේණිය** **කාලය පැය 03 යි.**

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරුකරගෙන ප්‍රශ්න අංක 01 - 05 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



01 මෙම රූපයෙන් නිරූපණය වන්නේ ............................................................ චෛත්‍යයේ හොඳම වාහල්කඩයි.

02 ස්තූපයක සතර දිශාවට මුහුණලා නිර්මාණය කර ඇති වාහල්කඩ ................................................ නමින් ද හැඳින්වේ.

03 වාහල්කඩ පාදම කොටස කළු ගලින් නිර්මාණය කර ඇති අතර ඉහළ කොටස ............................................ මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.

04 වාහල්කඩ ඉහළ කොටසේ බුදු පිළිම හා දේව ප්‍රතිමා තැන්පත් කර ඇති කවුළු ............................................ යනුවෙන් හැඳින්වේ.

05 මෙහි දක්නට ඇති කැටයම් නෙළා ඇති ශිල්ප ක්‍රමය .......................................................................... නම් වේ.

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වැකිවල හිස්තැනට සුදුසු වචනය යොදා වාක්‍යය සම්පූර්ණ කරන්න.**

06 ප්‍රාග් ඓතිහාසික යුගයේ මිනිසා සිතුවම් නිර්මාණය කර ඇත්තේ ............................................ තලයක් මතය.

07 නිල්, රතු වර්ණ සමානව එකතු කළ විට දම් වර්ණය සෑදේ. මෙම වර්ණ කාණ්ඩය අයත් වන්නේ ................................................................ වර්ණ කාණ්ඩයට ය.

08 පැදුරු / කළාල කර්මාන්තය සඳහා වඩාත් ප්‍රසිද්ධ වන්නේ ...................................................... ප්‍රදේශයයි.

09 චිත්‍රයක් වර්ණ කිරීමේ දී ළඟ වස්තු තද වර්ණවලින් හා දුරින් ඇති වස්තු ලා වර්ණ වලින් වර්ණ කිරීම ................................................................ ලෙස හඳුන්වයි.

10 මැටි කොටස් වශයෙන් එකතු කරමින් මූර්ති නිර්මාණය කරනු ලබන ශිල්ප ක්‍රමය ...................................................................... ලෙස හඳුන්වයි.

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දි ඇති රූපවලට ගැලපෙන **A , B, C, D, E** රූප සටහන්වලින් තෝරා එහි අක්ෂරය තිත් ඉර මත ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| 11 |  | ............................................ |  | A |
| 12 |  | ............................................ |  | B |
| 13 |  | ............................................ |  | C |
| 14 |  | ............................................ |  | D |
| 15 |  | ............................................ |  | E |

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16 මුරගල නිර්මාණයේ දී විවිධ අවස්ථාවල විවිධ මාධ්‍ය යොදාගෙන ඇත. පොළොන්නරු යුගයේ දී හමුවන මුරගල් සඳහා යොදාගෙන ඇත්තේ,

(1) ගල් මාධ්‍යය පමණි. (2) ගල් හා ගඩොල් ය.

(3) ගඩොල් හා බදාම ය. (4) ගල්, ගඩොල් හා බදාම ය.

17 අනුරාධපුර යුගයේ හොඳම කොරවක්ගල් නිර්මාණය හමුවන්නේ,

(1) අනුරාධපුර බිසෝ මාලිගයේ ය. (2) රාජ වෛශ්‍ය භුජංග මණ්ඩපයේ ය.

(3) ලංකාතිලක පිළිමගෙයිනි. (4) රත්නප්‍රාසාදයෙනි.

18 සාංචි ස්තූපයේ හර්මිකාව ලෙස හඳුන්වන අංගය ලංකාවේ ස්තූපවල හඳුන්වනු ලබන්නේ,

(1) දේවතා කොටුව ලෙසිනි. (2) හතරැස්කොටුව නමිනි.

(3) කොත් කැරැල්ල ලෙසිනි. (4) පේසා වළලු ලෙසිනි.

19 ශෛලිගත නාට්‍යයවලදී වේදිකා පසුතලය සැරසිලි කළ යුත්තේ,

(1) අවස්ථාවට උචිත ලෙස විශාල සැරසිලි යෙදීමෙනි.

(2) චාම් හා සරල සැරසිලි යෙදීමෙනි.

(3) අවස්ථාවෙන් අවස්ථාවට ගැළපෙන පරිදි සැරසිලි කිරීම.

(4) සැරසිලි කිසිවක් නොමැතිවය.

20 පඩිපෙළක දෙපස අත්වැලක් සේ යෙදූ ගල් පුවරු දෙක හඳුන්වන්නේ,

(1) ගල්වැටක් ලෙසය. (2) වලාකුළු බැම්ම ලෙසය.

(3) කොරවක්ගල ලෙසය. (4) ගල් මාවරයක් ලෙසය.

- **ප්‍රශ්න අංක 21 - 25 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වනසේ වාක්‍යය බැගින් ලියන්න.**

21 තලනවැඩ ..............................

..............................

22 පත්තම් කලාල ..............................

..............................

23 යාලි ..............................

..............................

24 අර්ධ උන්නත ..............................

..............................

25 සකපෝරුව ..............................

..............................

- **ප්‍රශ්න අංක 26 සිට ප්‍රශ්න අංක 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

26 වටදාගෙයක් යනු කුඩා ස්තූපයක ආරක්ෂාව සඳහා සාදනු ලබන ගෘහයකි. ලංකාවේ පළමුව ඉදිකළ වටදාගෙය නම් කරන්න. ..............................

27 පොළොන්නරු යුගයට අයත් හොඳම මුරගල හමුවන ස්ථානය නම් කරන්න. ..............................

28 වෙස් මුහුණු නිර්මාණයේ දි යොදාගන්නා ලී කොටයේ කිරිගතිය ඉවත්කොට ලීය පදම්කිරීම හඳුන්වන්නේ කුමන නමකින් ද? ..............................

29 හින්දු කෝවිල් ආශ්‍රිතව පවත්වන විවිධ උත්සව අවස්ථාවලදී භාවිතා කරන ''තේරු'' නම් වාහනය ඇදගෙනයාම සඳහා භාවිතා වන කඹය හඳුන්වන නම ලියන්න. ..............................

30 ලාක්ෂා කර්මාන්තයේ දී ලාක්ෂා තවරනු ලබන ක්‍රම දෙකකි. ඉන් එකක් නියපොතු වැඩ නමින් හඳුන්වයි. අනෙක් ශිල්ප ක්‍රමය නම් කරන්න. ..............................

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට දී ඇති **F G H I J** අක්ෂරවල රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.




31 F අක්ෂරයෙන් දැක්වෙන රූපය සිංහල සැරසිලි මෝස්තරවල අයත්වන කාණ්ඩය කුමක් ද?

.....................................................................................................

32 G අක්ෂරයෙන් දැක්වෙන මුද්‍රාව දැකිය හැකි බුද්ධ ප්‍රතිමාවක් නම් කරන්න. ..............................

33 H අක්ෂරයෙන් දැක්වෙන මෝස්තරය ඇතුලත්වන පාරිභාරික භාණ්ඩයක් නම් කරන්න.

.....................................................................................................

34 I අක්ෂරයෙන් දැක්වෙන සම්ප්‍රධායික මෝස්තරය බහුලව යොදාගත් යුගය ලියන්න.

.....................................................................................................

35 J අක්ෂරයෙන් දක්වා ඇති නිර්මාණ අයත්වන පාරම්පරික කලා කර්මාන්තය කුමක් ද?

.....................................................................................................

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා දී ඇති රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.



36 හඳුනාගැනීම ..............................

..............................

37 යුගය ..............................

38 මාධ්‍යය ..............................

39 ශිල්ප ක්‍රමය ..............................

40 විශේෂතාවය ..............................

..............................

(ලකුණු 40 යි)

---

## II කොටස

- චිත්‍රයේ පසු පිටෙහි ඔබේ විභාග අංකය / නම, පංතිය හා චිත්‍රයේ මාතෘකාව හෝ අංකය සඳහන් කරන්න.
- පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

01 ග්‍රාමීය වෙළඳ පොළක වෙළඳාමෙහි නිරතවන පිරිසක්

02 අවුරුදු උත්සවයක ඔබගේ සිත්ගත් අවස්ථාවක්

03 වනයක නිදහසේ හැසිරෙන වන සතුන්

04 සත්ව රූප ඇසුරෙන් තිර රෙද්දකට සුදුසු මෝස්තරයක්

05 පෙති පහක මලක් සහ කොළයක් යොදාගනිමින් තැගි ඔතන කඩදාසියකට මෝස්තරයක්

06 ළමා කතන්දර පොතකට ගැළපෙන සේ පොත් පිටකවරයක් (ලකුණු 60 යි)

## පිළිතුරු පත්‍රය - I කොටස

01 මිහින්තලේ බණ්ඨක / බණ්ඨක 02 ආයත / ආයික 03 ගඩොල් හා හුණු බදාම
04 විමාන 05 අර්ධ උන්නත ශිල්ප ක්‍රමය 06 කළුගල් තලයක් මත
07 ද්විතීයික වර්ණ 08 දුම්බර 09 වර්ණ පර්යාවලෝකනය 10 ඇඹීම
11 - C 12 - A 13 - B 14 - E 15 - D 16 - 4 17 - 4 18 - 2
19 -2 20 - 3 21 පිත්තල කර්මාන්තයේ භාණ්ඩ සැකසීමේ එක් ශිල්ප ක්‍රමයකි.
22 චාම් රටා යෙදූ පැදුරු විවීම මේ නමින් හැඳින්වේ.
23 හින්දු කෝවිල්වල දැකිය හැකි නිර්මාණාත්මක (නිරූඪ) සත්වයෙකි.
24 කැටයමක හරි අඩක් මතුකිරීම යනුවෙන් හැඳින්වේ.
25 මැටි කර්මාන්තයේදී භාණ්ඩ සැකසීම සඳහා යොදාගන්නා ප්‍රධාන උපකරණයකි.
26 ථූපාරාම වටදාගෙය 27 වටදාගෙයි (පොළොන්නරුව) 28 කිරි හින්දවීම
29 වඩම් 30 පට්ටල් වැඩ 31 උද්භිද 32 සමාධි / තොළුවිල බුදුපිළිමය
33 පිත්තල බන්දේසියක්/වෙනත් උචිත පාරිභාරික භාණ්ඩයක් 34 මහනුවර යුගයේ
35 ලාක්ෂා 36 පොළොන්නරු වටදාගෙයි සඳකඩ පහණ / වටදාගෙයි සඳකඩ පහණ
37 පොළොන්නරු යුගය 38 කළුගල් 39 අර්ධ උන්නත / අල්ප උන්නත
40 සියුම් කැටයම් නිර්මාණය / තීරු වශයෙන් සතුන් යෙදීම / ගවයා ඉවත්කර තිබීම

(2 x 20 = 40)

I කොටසට ලකුණු 40 යි.
II කොටසට ලකුණු 60 යි.
මුළු ලකුණු 100 යි.